(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 2(13).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2025 ඔක්තෝබර් 17 සිකුරාදා**

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 96/2025

ගරු සජිත් ප්‍රේමදාස මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා

ගරු ජීවන් තොන්ඩමන් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය

ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු ජේ.සී. අලවතුවල මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු චානක මාදුගොඩ මහතා

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු බී. ආරියවංශ මහතා

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු චතුර ගලප්පත්ති මහතා

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා

ගරු දිලිත් ජයවීර මහතා

ගරු සුරංග රත්නායක මහතා,— කොළඹ වරායේ සිට බහාලුම් 323ක් අනිවාර්ය භෞතික පරීක්ෂණයට භාජනය කිරීමකින් තොරව නිදහස් කිරීම සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීමටත් ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— ස්ථාපිත පිළිගත් රේගු කාර්ය පරිපාටිවලට පටහැනි ලෙස කොළඹ වරායේ සිට ආනයන බහාලුම් 323ක් අනිවාර්ය භෞතික පරීක්ෂණයට භාජනය කිරීමකින් තොරව නිදහස් කර ඇති බව හෙළි වී ඇති හෙයින් ද;

මෙම අක්‍රමිකතාවයන් පිළිබඳ පළ වන ප්‍රවෘත්ති පිළිබඳව සැලකිල්ල යොමු කරමින් ජනාධිපතිවරයා විසින් ලබාදුන් උපදෙස් අනුව භාණ්ඩාගාර ලේකම්වරයා විසින් පරීක්ෂණ කමිටුවක් පත් කරන ලදුව, එම පරීක්ෂණ කමිටුව විසින් සිය වාර්තාවේ අදාළ කරුණු පිළිබඳ සිය නිරීක්ෂණ ඉදිරිපත් කරමින් බහාලුම් නිදහස් කිරීමේ ක්‍රමවේදය නීතියට පටහැනි බවත්, “නිසි පරීක්ෂාවකින් තොරව බහාලුම් නිදහස් කිරීම ජාතික ආරක්ෂාව, ආදායම් එකතු කිරීම සහ මහජන ආරක්ෂාව විෂයයෙහි බරපතළ අවදානම් ඇති කරන” බවට නිරීක්ෂණය කරනු ලැබ ඇති හෙයින් ද;

ශ්‍රී ලංකා රේගු නිලධාරින්ගේ සංගමය විසින් එකී බහාලුම් නිදහස් කිරීමේ අක්‍රමික ස්වරූපය සැලකිල්ලට ගනිමින් එම බහාලුම්වල අන්තර්ගතය පිළිබඳ ඔවුන්ට වගකීම භාරගත නොහැකි බවට ප්‍රසිද්ධියේ ප්‍රකාශ කොට ඇති හෙයින් ද;

එම බහාලුම් මත්ද්‍රව්‍ය, ආයුධ සහ වෙනත් තහනම් ද්‍රව්‍ය නීති විරෝධී ලෙස මෙරටට ගෙන ඒම සඳහා භාවිතා කර තිබිය හැකි බවට පාර්ලිමේන්තුවේ දී සහ වගකිව යුතු බලධාරීන් විසින් ද බරපතළ චෝදනා එල්ල කර ඇති හෙයින් ද;

මත්ද්‍රව්‍ය විශාල තොගයන් සොයා ගැනීම සහ නීති විරෝධී ගිනි අවි සම්බන්ධ සිදුවීම්වල වර්ධනය ද ඇතුළුව ශ්‍රී ලංකාව තුළ මෑතක දී අනාවරණය වූ කරුණු සැලකිල්ලට ගත්කළ මෙයාකාරයේ සදොස් තත්ත්වයන් මහජනතාව මුහුණ දෙන තර්ජනවලට සෘජුව සම්බන්ධ වන බවට පවත්නා වූ සාධාරණ බිය තවදුරටත් තීව්‍ර වී ඇති හෙයින් ද;

මෙම කරුණ ජාතික ආරක්ෂාව, නීතිය ක්‍රියාත්මක කිරීම, මහජන ආරක්ෂාව සහ රටේ වරාය සහ රේගු පරිපාලනයේ අඛණ්ඩතාව සහ අව්‍යාජත්වය යන කරුණු හා සම්බන්ධවන අතර, මේ සියල්ල අතිශය ජාතික වැදගත්කමකින් යුත් කරුණු වන හෙයින් ද; සහ

මෙම කාරණය සමාජය තුළ අවිනිශ්චිතතාවයේ මූලාශ්‍රයක් බවට පත්ව ඇති හෙයින්;

ඉහත කරුණුවලටම සීමා නොවී පහත කරුණු ද ඇතුළත් වන පරිදි එකී බහාලුම් නිදහස් කිරීමට අදාළ සියලු කරුණු සොයා බලා වාර්තා කිරීමටත් ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි:

(අ) භෞතික පරීක්ෂාවකින් තොරව බහාලුම් නිදහස් කිරීමේ නීත්‍යානුකූලභාවය සහ යෝග්‍යතාව;

(ආ) ඒ හා සම්බන්ධ රජයේ බලධාරීන්, නිලධාරීන් සහ පෞද්ගලික ආයතනවල වගවීම;

(ඇ) එකී බහාලුම් කිසිවක් තුළ හෝ නීති විරෝධී, තහනම් කරන ලද හෝ හානිකර භාණ්ඩ අඩංගු වී පැවතියේද යන්න;

(ඈ) මෙම ක්‍රියාවලියේ දී ශ්‍රී ලංකා රේගුවේ සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්යභාරය සහ වගකීම;

(ඉ) එවැනි අක්‍රමිකතාවයන්ගෙන් ආරක්ෂා වීම සඳහා පවත්නා නීති, රෙගුලාසි සහ ක්‍රියාපටිපාටිවල ප්‍රමාණවත්භාවය;

(ඊ) ඉදිරියේදී එවැනි සිදුවීම් ඇතිවීම වළක්වාලනු ලබන බවට සහතික කිරීම සඳහා අවශ්‍ය නීතිමය, පරිපාලනමය සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සඳහා නිර්දේශ.

2. (අ) කථානායකවරයා විසින් කාරක සභාවෙහි සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් නම් කළ යුතු ය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101 හි විධිවිධාන ප්‍රකාරව කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුට (12) නොවැඩි විය යුතු ය.

3. එම කාරක සභාවට —

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි ලිඛිතව හෝ වාචිකව, ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වාරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද,

බලය තිබිය යුතු ය.

4. කාරක සභාවේ වාර්තාව එහි පළමු රැස්වීමේ දින සිට මාස තුනක (03) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කරනු ලබන එවැනි කාල පරිච්ඡේදයක් ඇතුළත දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.